# යන්තම් පණ බේරුණා.

මම වනජීවී දෙපාර්තමේන්තුවට සම්බන්ධ වුනේ 1999 අවුරුද්දෙදි. හෝර්ටන් තැන්නේ පොඩි කාලයක් සේවය කරලා ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයට රාජකාරි සඳහා ගියා. ඒ වෙනකොට මට රාජකාරි ජීවිතයේ ලොකු අත්දැකීම් තිබුණෙත් නෑ. ලුණුගම්වෙහෙරට ගියේ 2002 අවුරුද්දෙදී.

ලුණුගම්වෙහෙරට යාබදව යාල ජාතික උද්‍යානයත් අනෙක් පැත්තෙන් උඩවලව ජාතික උද්‍යානයත් තියෙනවා. මේ උද්‍යාන දෙකේම ගොඩක් අලි ඇතුන් ඉන්නවා. ඒ නිසා ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයේ නිතරම අලි ඇතුන් ගැවසෙනවා.

වනජීවී අපේ කාර්ය භාරයක් සතුන්ගේ ආහාර, ජලය, ලවණ අවශ්‍යතා සපුරා ගන්න උදව් කරන එක. මේ අලින්ගේ ලවණ අවශ්‍යතාවය සපයන්න අපි වැඩ කලා. වලවල් කපලා හම්බන්තොට ලුණු ලේවායෙන් ලුණු ගෙනත් පුරවලා ලුණු නිධි හැදුවා. මේ එක වලක් සාමාන්‍යයෙන් අඩි 4 x අඩි 4 x අඩි 4 ප්‍රමාණයේයි. ලුණු නිධි වලින් අලින් ප්‍රයෝජන ගන්නවාද කියල, පසු විපරම් කරල, බලන්න ඕනෑ. අපි නිතරම ඒ කාර්යය කරනවා.

දවසක් මම බොල්හිඳගල කියන ප්‍රදේශයේ මුර සංචාරයකට ගියා. අපේ කට්ටියත් එක්ක වාහනයකින්. ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයට ඇතුළු වෙන්නේ තණමල්විල කලු පාලම තියන තැනින්. එදා මුර සංචාරය කරලා ආපසු කාර්යාලයට එන ගමන් ඒ කිට්ටුව තිබුණු ලුණු නිධි කීපයක් බලන්න හිතුනා. වාහනය නතර කරන් ඉන්න කියලා මම බැහැලා ගියා ලුණු නිධි තියෙන තැනට.

මේ ලුණු නිධි තිබුණේ මම බැහැපු තැන ඉඳලා මීටර 20 ක විතර දුරින්. මුලින්ම තියෙන්නේ ගස් අඩු පිට්ටනිය වගේ ප්‍රදේශය. ඊලඟට ලුණු නිධි. ඊට පස්සේ කැලෑව.

මම බැලුවා ලුණු නිධි සත්තු කාලා තියෙනවද කියලා. එතන වන අලින්ගේ වසුරු තිබුණා. අලි ඇතුන් ලුණු නිධි පාවිච්චි කරා කියලා හොඳින්ම පෙනුනා. මම ලුණු නිධි පරීක්ෂා කර කර හිටියා.

එකපාරටම ශබ්දයක් ඇහිලා බලනකොට මගේ ළඟ විශාල අලියෙක්. උගේ ශබ්දයෙන් මම ඒ පැත්ත බැලුවේ. අපි දෙන්නා අතර දුර අඩි 5 ක් විතර ඇති. මගේ ඇගේ ලොමු දැහැ ගැනුනා. උගුර කට වේලී ගියා. මරණ භය දැනුනා. ඊළඟ මොහොතේ මම ක්‍රියාත්මක කරපු රොබෝ කෙනෙක් වගේ වේගයෙන් අනිත් පැත්ත හැරිලා දුවන්න ගත්තා. මගෙ කකුල් වලට පුදුම පණක් ආවේ. මම වාහනය නතර කරපු පැත්තටම හැල්මේ දිව්වා. අලියා මගේ පස්සෙන් ලඟ ලඟම එනවා මට දැනුනා.

අපේ කට්ටිය වාහනයේ දොරක් ඇරගෙන අලියට කෑගැහුවා. ඒ ශබ්දයට අලියාගේ සැර බාල උනා. මට වාහනයට නැග ගන්න පුළුවන් වුනා. ඒත් එක්කම අපි වාහනය වේගයෙන් ඉදිරියට ගෙනිච්චා.

එදා මම ඉගෙන ගත්තා වනාන්තරේ යනකොට සතුන් පිළිබඳ හොඳ අවබෝධයෙන් යන්න ඕනෑ කියන එක. ඒ සිද්ධිය මාගේ ජීවිතයට හොඳ අත්දැකීමක් වුනා.

ඒ දැනුන ජීවිත භය මට අද වගේ මතකයි.

# ආර්. පී. එස්. උඩුපෝරුව මහතා



ආර්. පී. එස්. උඩුපෝරුව මහතා වනසත්ව අඩවි ආරක්ෂකවරයකු වශයෙන් වනජීවි දෙපාර්තමේන්තුවේ රැකියාවට පැමිණියේ 1999 වසරේ ජුනි 01 වැනිදාය.

තම වසර 22 ක් පමණ වන සේවා කාලය තුල ඔහු හෝර්ටන් තැන්න හා විල්පත්තු ජාතික උද්‍යාන වලදී, මුතුරාජවෙල, වික්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ අභය භූමි වලද සේවය කර මේ වනවිට අංගම්මැඩිල්ල ජාතික උද්‍යානයේ උද්‍යාන භාරකරු ලෙස සේවය කරයි.

උඩුපෝරුව මහතා අඩවි ආරක්ෂකවරුන් සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ලබාදෙන වනජීවී කළමණාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලව හදාරා ඇත.

උඩුපෝරුව මහතාගේ දයාබර බිරිඳ ගුරුවරියක වන අතර ඇය අරණායක රීසද ජාතික පාසැලේ සේවය කරනු ලබන්නීය. ඔහු ආදරණීය දියණියන් දෙදෙනෙකුගේ පියෙකි.

ඔවුන් පදිංචිව සිටිනු ලබන්නේ මාවනැල්ල ප්‍රදේශයේය.

# ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය

අප රටේ පළාත් නාමකරණයට අනුව ජෛව විවිධත්වයෙන් සුවිශේෂී වූ ඌව පළාතේ පිහිටා ඇති අම්ල වනපෙතක් වන ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය, තණමල්විල, වැල්ලවාය, කතරගම සහ බුත්තල මොණරාගල දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට සහ ලුණුගම්වෙහෙර හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත්ව පිහිටා ඇත. මෙම ජාතික උද්‍යානය පක්ෂීන් හා අලි ඇතුන් සඳහා වැදගත් වාස භූමියක් වේ. යාල සිට උඩවලව ජාතික උද්‍යානයට සංක්‍රමණය වන අලි ඇතුන්ට කොරිඩෝවක් ලෙසද ක්‍රියා කරන මෙය වන අලි ඇතුන්ගේ ආරක්ෂාව සඳහා හෙක්ටයාර් 23,498 ක වපසරියකින් යුතු ව 1995 දෙසැම්බර් 08 වන දින ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය ලෙස ස්ථාපිත කරන ලදී .

ජාතික උද්‍යානය කොළඹ සිට නිරිත දෙසින් 261 km දුරින් පිහිටි ලුණුගම්වෙහෙර ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ පිහිටා ඇති වාර්ෂික නියඟයට නිරාවරණය වූ උද්‍යානයකි. උද්‍යානයේ උන්නතාංශය මීටර් 91 (අඩි 299) කි. මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 14 ක්, එනම් හෙක්ටයාර 3283 ක් ජලාශය යටතේ ඇති ඉඩම් වන අතර උද්‍යානයේ සැලකිය යුතු ප්‍රදේශයක් ලුණුගම්වෙහෙර ජලාශය විසින් අත්පත් කරගෙනද ඇත. ලුණුගම්වෙහෙර සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය 30 °C (86 °F) වන අතර මේ අනුව උද්‍යානයේ සම්පූර්ණ වියළි ප්‍රදේශය හෙක්ටයාර 20,156.8 කි. මෘදු රැළි රහිත තැනිතලා සහ පාෂාණ තට්ටුවලින් ආධිපත්‍යය දරන මෙම වියළි කලාපීය උද්‍යානය වාර්ෂික නියඟයකට මුහුණ දෙයි.

ඉතිහාසය හා බැඳුණු වැදගත්කමක් ඇති බව නීලගිරි චෛත්‍යය හා සුන්බුන් වූ විහාරයක නටබුන්ද හමු වීමෙන් පෙනී යයි. එසේම විහාරමහා දේවිය විවාහ වූ ස්ථානය යැයි සැලකෙන මගුල් මහා විහාරයද ඒ ආසන්නයේ පවතියි. එම විහාරය තුළ ඉදිකරන ලද මඟුල් පෝරුවක නටබුන් හා ආසියාව තුළ මෙතෙක් හමු වී ඇති ඇත් ගොව්වන් සතර දෙනෙකුගෙන් යුක්ත එකම සඳකඩපහන අදටද ඔබට නැරඹීමට හැකියාව ඇත.

ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය වනාන්තර ස්ථර කිහිපයකින් යුක්ත වේ. ලඳු කැලෑ සහ තෘණ බිම් වලින් මෙම වනාන්තර සෑදී ඇත. තේක්ක සහ යුකැලිප්ටස් වගාවන් දැන් වනාන්තරයේ බහුලව දක්නට ලැබේ. වියළි මිශ්‍ර සදාහරිත වනාන්තරයක් සහිත උද්‍යානය ප්‍රධාන වශයෙන් වීර, පලු, කුණුමැල්ල, උල්කෙන්ද, කැප්පෙට්ටියා, කෝන් මෙන්ම තේක්ක සහ යුකැලිප්ටස් වගාවන් ඇතුළු විශාල තණබිම් වන මයුර තණ, ඉලුක්, ගිණියාතණ, හීන්තඹල ආදී තෘණ බිම් සහ ලඳු කැලෑ වලින් සමන්විත වන අතර ජාතික උද්‍යානයේ වෘක්ෂලතාවන්ගේ මෙවැනි විවිධත්වය නිසා මෙහි ජීවත් වන සතුන්ට ආහාර, සෙවණ හා රැකවරණය නොවඩුව ලැබේ.

මෙම ප්‍රදේශයේ පාරිසරික තත්ත්වයට ඔරොත්තු දෙන කුඩා කුහුඹුවාගේ පටන් ගොඩබිම් විසල් අලි ඇත් පරපුර දක්වා වූ සත්ත්ව නියෝජනයක් දැක ගත හැකිය. අපා,දෙපා,සිව්පා සහ බහුපාධාරි

වනදරුවන්ගේ ක්‍රියාකාරකම් වලින් සපිරි මෙහි මත්ස්‍ය විශේෂ 21ක්, උභයජීවීන් විශේෂ 12ක්, උරග විශේෂ 33ක්, පක්ෂීන් විශේෂ 183ක් සහ ක්ෂීරපායින් විශේෂ 43ක් දැකගත හැක.

ජෛව විවිධත්වයෙන් පොහොසත් මෙම උද්‍යානයේ ශ්‍රී ලංකාවේ අලි, මී හරකා, වල් ඌරා, මුගටියා, දඬු ලේනා, වලසුන්, ගරා කටුස්සා, තොල විසිතුරු කටුස්සා, තාරකා ඉබ්බන්, පිඹුරා ආදි ජීවී විශාල සංඛ්‍යාවකට හිතකර වාසස්ථානයක් වේ. ලාහුගල ආසනනයේ අලින්ගේ ප්‍රියතම ආහාරයක වු බෙරු තණ බිම් පැවතීම හේතුවෙන් අලින් නිතර එහි සැරිසරනු දැක ගත හැක. මෙම ප්‍රදේශය අලින්ගේ ආහාර ගබඩාව ලෙසින්ද හඳුන්වයි.



**දිවියා**



**තිත් මුවා**

ලුණුගම්වෙහෙර ජලාශය සහ උද්‍යානයේ අනෙකුත් ජල කඳන් දහස් ගණනක් ජල කුරුල්ලන්ගේ නිවහන වේ. ආවේණික සහ සංක්‍රමණික විශේෂ 200කට ආසන්න ප්‍රමාණයකගේ අභිජනන භූමියක් බවට පත් වී ඇත. මෙහි දක්නට ලැබෙන පක්ෂි විශේෂ අතර වළි කුකුලා, වන සැරටිත්තා, වත නිල් මල් කොහා, ලංකා දුඹුරු දෙමලිච්චා, පැස්තුඩුවන්, අළුකෑදැත්තා ආදී පක්ෂීන් වේ. ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය ශ්‍රී ලංකාවේ විවිධ පක්ෂීන් සඳහා නිවහනක් වන බැවින් කුරුල්ලන් නැරඹීමට ප්‍රියතාවයක් දක්වන්නන් සඳහා වඩාත් සුදුසු උද්‍යානයක් වේ.



**ඊන කාවා**



**පොරෝ කෑදැත්තා**

උද්‍යානයේ මූලස්ථාන කාර්යාලය වෙත පිවිසිය හැකි ප්‍රධාන මාර්ග දෙක ලෙස කොළඹ සිට රත්නපුර හරහා උඩවලව, තණමල්විල හරහා ලුණුගම්වෙහෙරට ආසන්න වශයෙන් 231km වන අතර කොළඹ සිට හම්බන්තොට හරහා තිස්සමහාරාම, තණමල්විල සිට ලුණුගම්වෙහෙරට ආසන්න වශයෙන් 265km වේ. ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ලුණුගම්වෙහෙර කොළඹ සිට කිලෝමීටර් 261 ක් දුරින් පිහිටා ඇති අතර දකුණු පළාතේ තිස්සමහාරාමය හරහා හෝ සබරගමුව පළාතේ කලවාන හරහා ප්‍රවේශ විය හැකිය.

වියළි කලාපීය වනාන්තරයක් වන උද්‍යානය සෑම වසරකම නොවැම්බර් සහ ජනවාරි අතර වර්ෂාවත් සමඟ සෙන්ටිග්‍රේඩ් අංශක 30කට ආසන්න උෂ්ණත්වයක් වාර්තා කරන බැවින් උද්‍යානය වසර පුරා නැරඹීමට උද්‍යානයට පිවිසුම් ස්ථාන දෙකක් ඇත.  ලුණුගම්වෙහෙර යනු සංචාරකයින් අඩු ජාතික උද්‍යානයක් වන බැවින් ඔබට සාමකාමීව වනසිරිය රසවිඳීමට උද්‍යානයට පිවිසීමට හම්බන්තොට - වැල්ලවාය මාර්ගයේ තණමල්විල අසලින් එක් පිවිසුමක් පිහිටා ඇති අතර අනෙක් පිවිසුම සෙල්ල කතරගම - බුත්තල පාරේ ගල්ගේ දෙසින් පිහිටා ඇත. බොහෝ දෙනා මෙම ජාතික උද්‍යානයට වඩා මේ ආසන්නයේ පිහිටි යාල ජාතික උද්‍යානයට වැඩි ප්‍රියතාවයක් දක්වන බැවින් ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය පිවිසුමෙහි ඉතා අඩු වාහන තදබදයක් දැකිය හැකි වුවද මෙම ජාතික උද්‍යානයද වන සතුන් ගහණ සංචාරයට සුදුසු ප්‍රදේශයකි.



**නව පිවිසුම**

**උපුටා ගැනීම්**


ශ්‍රී ලංකාවේ ජාතික වනෝද්‍යාන (පී.ඇම්.සේනාරත්න)

ශ්‍රී ලංකාවේ වනාන්තර,වනෝද්‍යාන සහ වන ආරක්ෂක නීති(පීරිස් රණසිංහ)

Wildlife tour sri lanka

Wikipedia

ecoteam

reddottours

**ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය පිළිබඳව විස්තරයේ ඇති වෘක්ෂයන්ගේ නම් ලැයිස්තුව**

**லுணுகம்வெஹெர தேசிய பூங்கா தொடர்பான விளக்கத்தில் காணப்படும் மரங்களின் பெயர்ப் பட்டியல்**

**List of trees in the Ritigala Lunugamvehera National Park**

| Sinhala Names | Tamil Names | English Names | Botanical Name |
|---|---|---|---|
| පලු | பாலை | Palu | *Manilkara hexandra* |
| වීර | வீரை | Hedge box wood | *Drypetes sepiaria* |
| කුණුමැල්ල | கரிமரம் | Kunumella | *Diospyros ovalifolia* |
| උල්කෙන්ද | உழுவிந்தை | Ul kenda | *Polyalthia korinti* |
| කැප්පෙට්ටියා | தெப்பாடி | Kappetiya | *Croton lacciferus* |
| කෝන් | பூக்கம் | Kon | *Schleichera oleosa* |
| තේක්ක | தேக்கு | Teak | *Tectona grandis* |
| යුකැලිප්ටස් | யூக்கலிப்டஸ் | Eucalyptus species | |
| මයුර තණ | மயுர புல் | Mayaurathana | *Chloris montana* |
| ඉලුක් | இலுக் | Illuk | *Imperata cylindrica* |
| ගිණියාතණ | கினியா புல் | Guinea tana | *Panicum maximum* |
| හීන්තඹල | குரங்கு வெற்றிலை | Hinthambala | *Carmona microphylla* |

**ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය පිළිබඳව විස්තරයේ ඇති සතුන්ගේ නම් ලැයිස්තුව**

**லுணுகம்வெஹெர தேசிய பூங்கா தொடர்பான விளக்கத்தில் காணப்படும் விலங்குகளின் பெயர்ப் பட்டியல்**

**List of animals in the Lunugamvehera National Park**

| Sinhala Name | Tamil Name | English Name | Scientific name |
|---|---|---|---|
| අලියා | ஆசிய யானை | Asian elephant | *Elephas maximus* |
| දිවියා | சிறுத்தை | Leopard | *Panthera pardus kotiya* |
| වලහා | தேன் கரடி | Sloth bear | *Ursus ursinus* |
| වල් ඌරා | காட்டுப் பன்றி | Wild boar | *Sus scrofa* |
| තිත් මුවා | புள்ளி மான் | Spotted deer | *Axis axis ceylonensis* |
| මී හරකා | எருமை | Water buffalo | *Bubalus bubalis* |
| මුගටියා | இந்திய சாம்பல் கீரிப்பிள்ளை | Common mongoose | *Herpestes edwardsi* |
| දඬු ලේනා | பழுப்பு மலை அணில் | Giant squirrel | *Ratufa macroura* |
| ගරා කටුස්සා | பொதுவான தோட்டப்பல்லி | Common agamid lizard | *Calotes versicolor* |
| තොල විසිතුරු කටුස්සා | சிவப்பு உதட்டுப் பல்லி | Red lipped lizard | *Calotes ceylonensis* |
| තාරකා ඉබ්බන් | நட்சத்திர ஆமைகள் | Star tortoise | *Testudo elegans* |
| පිඹුරා | மலைப்பாம்பு | Python | *Python molurus* |
| වලි කුකුළා | இலங்கைக் காட்டுக் கோழி | Sri Lanka junglefowl | *Gallus lafayetii* |
| වන සැරටිත්තා | சிலோன் வுட்ஷ்ரைக் | Sri Lanka woodshrike | *Tephrodornis affinis* |
| ලංකා දුඹුරු දෙමලිච්චා | பழுப்பு நிற மூடிய புழுணி | Sri Lanka brown capped babbler | *Pellorneum fuscocapillus* |
| අළු කෑදැත්තා | இலங்கை சாம்பல் இருவாய்ச்சி | Sri Lanka grey hornbill | *Ocyceros gingalensis* |
| වත නිල් මල් කොහා | நீல முகச் செண்பகம் | Blue – faced malkoha | *Phaenicophaeus viridirostis* |

| Sinhala Name | Tamil Name | English Name | Scientific name |
|---|---|---|---|
| පැස්තුඩුවන් | சாம்பல் கூழைக்கடா | Spot - billed pelican | *Pelecanus philippensis* |
| පොරෝ කෑදැත්තා | மலபார் கறுப்பு வெள்ளை இருவாய்ச்சி | Malabar pied horn bill | *Anthracoceros coronatus* |
| අහිකාවා | இந்திய நெடுங்கிளாத்தி | Oriental darter / Snake bird | *Anhinga melanogaster* |

**සංස්කාරක -** දම්මිකා මල්සිංහ, අතිරේක ලේකම් (ව්‍යාපෘති) , වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

**උද්‍යානය පිළිබඳව විස්තර -** හසිනි සරත්චන්ද්‍ර, ප්‍රධාන මාධ්‍ය නිලධාරි, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,

මහේෂා චතුරානි පෙරේරා (අභ්‍යාසලාභී උපාධිධාරි), වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**දෙමළ පරිවර්තනය -** ඒ.ආර්.එෆ්. රිෆ්නා, සංවර්ධන නිලධාරි, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

**ඉංග්‍රීසි පරිවර්තනය -** අසෝක පලිහවඩන, පරිවර්ථක, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

**වෙබ් අඩවි සැකසුම -** සී.ඒ.ඩී. ඩී.ඒ. කොල්ලුරේ, කළමණාකරන සේවා නිලධාරි, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

**ඡායාරූප -** රෝහිත ගුණවර්ධන, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව